# දේශීය නිෂ්පාදන ආර්ථිකයට සැලසුම් සහගත කාර්මික සංවර්ධනයක්

ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත දේශීය ආර්ථිකයේ ඉතා වැදගත් තැනක් ගන්නකි. එමෙන්ම ඒ සඳහා සේවා සපයන ඉතා පැරණි දීර්ඝ කාලයක ගමන් මගක් හිමි එකම රාජ්‍ය ආයතනය ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයයි. විවෘත ආර්ථිකයත් සමග රටතුළට ගලා ආ විදේශ භාණ්ඩ මෙරට වෙළෙඳපොල ආක්‍රමණය කළ අතර, දේශීය වෙළෙඳ පොල විදේශීය ආනයන වලින් පොහොසත් විය. ශ්‍රී ලාංකික සමාජය විදේශ ණය, විදේශ සහනාධාර ලබන තත්ත්වයක් දක්වාම මේ ව්‍යවසනය පැතිරීමේ අවසාන ප්‍රතිඵලය වූයේ දේශීය නිෂ්පාදනයක් නොමැති ආර්ථිකයකට ශ්‍රී ලංකාව පත්වීමයි. එමගින් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත කරුවන්ට සිදුවූයේ නිෂ්පාදන, අමුද්‍රව්‍ය, වෙළෙඳ පොළ සම්බන්ධ බරපතල ප්‍රශ්නවලට මුහුණ දීමටයි. මෙරට නිෂ්පාදිත භාණ්ඩයකට වඩා අඩු මුදලකට විදේශ භාණ්ඩයක් වෙළෙඳපොලෙන් ලබාගත හැකිවීම නිසා මෙරට සුළු හා මධ්‍ය පරිමාණ ආයෝජකයින්ට මුහුණපෑමට සිදුවූයේ විසඳුමක් නොමැති ප්‍රශ්ණයකටය. අභාවයට ගිය සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත නගා සිටුවීමට නව රජය යටතේ ඇරඹි වැඩ පිළිවෙල ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ ශක්තිමත් අත්තිවාරමකින් නව පන්නරයක් ගෙන ඇත.

ඒ පිළිබඳව ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපති ආචාර්ය සනත් අලහකෝන් මහතා සමග කොළඹ විශ්ව විද්‍යාලයේ ජනමාධ්‍ය අධ්‍යාපන අංශයේ රත්නායක ශිෂ්‍යාව කරන ලද සාකච්ඡාවක් -

**ප්‍ර :-** **කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත නගා සිටුවීම ඔබ ආයතනයේ අරමුණ නම්; රජය ඇරඹි වැඩපිලිවෙල ඉතාමත් ප්‍රාථමික ග්‍රාමීය මට්ටමෙන් ආරම්භ කිරීමට සිද්වී ඇතැයි සිතීම හරිද?**

**පි:-** ඔව්. මූලිකවම කුඩා හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය යටතේ කළයුතු ප්‍රධානතම කාර්ය වී ඇත්තේ මෙතෙක් අසංවිධානාත්මකව සිටින සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත කරුවන් විධිමත් ලෙස සංවිධානය කිරීමයි. ඒ තුළින් සමස්ත කුඩා හා ග්‍රාමීය කර්මාන්ත සඳහා අවශ්‍ය සේවා සැපයීමට, වෙළෙඳ පොළ සකසා දීමට, ණය පහසුකම් ලබාදීමට විධිමත් වැඩපිළිවෙලක් සැකසීම පහසුවෙනවා. ඊට පිළියමක් ලෙස කර්මාන්තකරුවන් ලියාපදිංචි කිරීමට කුඩා හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශයේ ප්‍රධානත්වයෙන් කටයුතු යොදා තියෙනව. ලංකාව පුරා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමෙන් හස්ත කර්මාන්ත කුඩා හා ග්‍රාමීය කර්මාන්ත ලියාපදිංචි කිරීම දැන් කෙරෙනවා. මේ සඳහා කර්මාන්ත සංවර්ධන මණ්ඩලයේ දිස්ත්‍රික් කාර්යාල වලින් උපදෙස් සේවා ලබාදීමට කටයුතු යොදා තියෙනවා.

**ප්‍ර.:-** **කුඩා හා ග්‍රාමීය කර්මාන්ත නව අමාත්‍යාංශයක ආරම්භයත් සමඟ සතුටුදායක ගමන් මගක් තිබෙනවාද?**

**පි.:-** කුඩා හා ග්‍රාමීය කර්මාන්ත සඳහාම මේ වනතුරු සකස් වුණු අමාත්‍යාංශයක් තිබුණෙ නැ. ඒ හේතුවෙන් දේශීය කර්මාන්තය නගා සිටුවීමට අවශ්‍ය කිසිදු පියවරක් ගෙන තිබුණෙත් නැ. මේ වන විට කුඩා හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය දේශීය කර්මාන්ත සඳහාම සකස් වුණු අමාත්‍යාංශයක් බැවින්, දේශීය කර්මාන්ත නැවත නගා සිටුවීමේලා අවශ්‍ය මූලිකයා ලෙස කටයුතු කිරීමට හැකිවී තියෙනවා. මේ තුළින් දේශීය කර්මාන්ත සඳහා අවශ්‍ය සේවා සැපයීමට, වෙළෙඳපොළ පහසුකම්; කර්මාන්ත ප්‍රතිපත්ති සැකසීම මගින් කර්මාන්ත සඳහා අවශ්‍ය හිතකර පරිසරයක් සහ දිරි ගැන්වීම් ලබාදීමට හැකියාව ලැබෙනවා. දේශීය කර්මාන්ත කරුවන්ට අවශ්‍ය වෙළඳෙපොල සකස් කර දීම කළ නොහැකි කාර්යයක්ම නොවේ. තත්ත්වයෙන් උසස් භාණ්ඩ සපයනවා නම් වෙළෙපොළ සකසා දිය හැකියි. මේ සඳහා අමාත්‍යාංශය අත්හදා බැලීම් කිහිපයක් කර තිබෙනවා. ඒ යටතේ වූ අත්හදා බැලීමක් ලෙස ශිල්ප 2004 දක්වන්න පිළිවනි.

**ප්‍ර.:-** **" සම්පත් පැතිකඩ " (Resource Profile) සංකල්පය පිළිබඳව විස්තර කළොත්...**

**පි.:-** කාර්මික සංවර්ධන මණ්ඩලය මේ වන විට නව වැඩ පිළිවෙළක් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සංවර්ධනයට ක්‍රියාත්මක කරලයි තියෙන්නේ. "සම්පත් පැති කඩත්" තියෙන්නේ. ග්‍රාම නිලධාරී මට්ටමින් සම්පත් පිළිබඳව තොරතුරු දත්ත පරිගණක ගතකොට සැකසීමයි. එමගින් කර්මාන්ත පද්ධතියම සැලසුම් කරන්න පහසු වෙනවා. අමුද්‍රව්‍ය සොයා ගැනීමට මේ මගින් පහසු වන අතර, වෙළෙඳපොළ අධ්‍යයන මගින් ආයෝජනයන් වැඩිකර ගැනීමටද අදහස් කරනවා.' මේ වැඩ පිළිවෙල සුනාමියෙන් ව්‍යසනයට පත් ප්‍රදේශවල හිතකර ප්‍රතිපත්තිමය තීරණ ගෙන තිබෙනවා. එම තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු සංඛ්‍යා දත්ත ප්‍රතිපාදනය කා.ස.ම. කාර්යයක්. උදාහරණ ලෙස දේශීය ඉංජිනේරු තඹ, පිත්තල, කර්මාන්ත සඳහා ප්‍රයෝජනයට ගන්නා අබලි ද්‍රව්‍ය අපනයන පාලනයට නීරුබඳු පැනවීම

දේශීය කර්මාන්ත දිරිගැන්වීමට ඉතා හොඳ ප්‍රතිපත්ති තීරණයක්. කා.ස.ම. ඒ සඳහා දායක වීම සතුටු දායක ගමන් මගක ආරම්භයක් වෙනවා.

**ප්‍ර.:- "සුනාමිය" ඔබ ආයතනයේ නව වැඩ පිලිවෙලට විශාල බාධකයක් වුණා නේද?**

**පි.** ඒ පිළිබඳව අපි ඉතා ඉක්මනින්ම කළේ සමීක්ෂණයක් කරල අවශ්‍ය තොරතුරු දත්ත ලබා ගැනීමයි. එයින් විනාශ වූ කර්මාන්ත, ප්‍රදේශ, විනාශව ඇති ආයෝජන ස්ථාන හඳුනාගැනීමට හැකිවී තිබෙනවා. ඊට පිළියම් සඳහා මූලික පියවර අපිට ක්‍රියාත්මක කරන්න පුලුවන් වුනා. ඒ පළිබඳව මේ සඟරාවේ වෙනමම විස්තර වෙන නිසා ඒ ගැන යළිත් විස්තර කිරීම අවශ්‍ය නැහැ.

**ප්‍ර. "ගුරු පැහැයෙන් රන් පැහැයට" සංකල්පය තුළ අපට, අපේකම වගේ හැඟීමක් දැනෙනවා. මේකත් නව දැක්මක් නේද?**

**පි.** "ගුරු පැහැයෙන් රන් පැහැයට" යන සංකල්පය යටතේ කර්මාන්ත ගම්මාන දහසක් සංවර්ධනය කිරීමට කුඩා හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය සැලසුම් කර තිබෙනවා. මෙය දේශීය කර්මාන්තය නැවත පණගැන්වීමේලා පුමුඛ වැඩ පිළිවෙළක්. මෙතෙක් අසංවිධාත්මකව කර්මාන්ත කරුවන් කර්මාන්ත සමුපකාරය මගින් සංවිධානාත්මක කරනු ලබනවා. එම නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිතිය මගින් කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන මිලට ගෙන විකිණීම් කරන අතර, ඒ සඳහා සේවා ලබාදීමට ග්‍රාමීයව ආරම්භ කරන පොදු සේවා මධ්‍යස්ථානයන්ද නඩත්තු කිරීම හා කළමණාකරණය කරනු ලබනවා. මේ මගින් කර්මාන්ත ගම්මාන සාමූහික වැඩ පිළිවෙළක් වෙත යොමු කරනු ලබනවා. කුමන ආකාරයේ නිශ්පාදන මේ ගම්මාන වලින් පටන්ගත යුතුද, ආරම්භ කල යුතුද යන්න සැලසුම් කරනු ලැබීමක් දැනට කරගෙන යනවා.

උදාහරණයක් ලෙස අනුරාධපුර දිස්ත්‍රික්කයේ කම්මල් ගම්මානයක් අරඹා තියෙනවා. මෙහිදී අවශ්‍ය අමුද්‍රව්‍ය සපයා දීමද, ස්ථාවර වෙළෙඳ පොළක් ලබා දීමද අමාත්‍යාංශය මැදිහත් වීමෙන් සාර්ථක ප්‍රතිඵල ලබාදීමට පියවර ගෙන තිබෙනවා. දේශීය මෙන්ම විදේශීය වෙළෙඳ පොළ ආයෝජකයින් යොමු කිරීමේ ලා ඉදිරියේ වැඩපිළිවෙල සකස් කෙරෙනවා.

**ප්‍ර.:- "සුනාමියෙන්" සිදුවූ කර්මාන්ත විනාශය පිළිබඳව ඔබ ආයතනයෙන් කළ සමීක්ෂණ තොරතුරු වලට අනුව දැනට ක්‍රියාත්මක කිරිමට අපේක්ෂිත දිගු හා කෙටි කාලීන වැඩ පිළිවෙළ කුමක්ද?**

**පි.:-** සුනාමියෙන් විනාශයට පත්වූ කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත කරුවන් නැවත නගා සිටුවීමේ ලා විශාල වැඩ පිළිවෙලක් දියත් කිරීමට කුඩා හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය සමග අනුබද්ධව කර්මාන්ත සංවර්ධන මණ්ඩලයෙ පටන්ගෙනයි තියෙන්නේ.

දැනට සුනාමි විපතට පත් කර්මාන්ත සමීක්ෂණයෙන් හඳුනාගත් කුඩා පරිමාණයේ ව්‍යාපෘති, සඳහා රුපියල් 15000/- අඩු ආයෝජනයකින් නැවත ආරම්භ කිරීමට හැකි කර්මාන්ත සඳහා අමුද්‍රව්‍ය හා සරල යන්ත්‍ර උපකරණ ප්‍රදානයක් ලෙස ලබාදෙමින් එම කර්මාන්ත නැවත ආරම්භ කිරීමට ක්‍රියාකරගෙන යනවා.

ඒ හැරුණු විට දීර්ඝ කාලීනව ව්‍යාපෘති යටතේ කර්මාන්ත ශාලා විනාශවූ කර්මාන්තකරුවන් සඳහා නැවත කර්මාන්තශාලා ගොඩ නැගීමට අවශ්‍ය පහසුකම් සඳහා තාවකාලික ගොඩනැගිලි ලබාදීමට අදහස් කර තියෙනවා. එයින් " පෙර වැඩුම් " මධ්‍යස්ථාන (Incubators) පහසුකම් කාර්මික ජනපද ආරම්භ කිරීමට හැකියාව ලැබෙනවා. එමගින් ඔවුන්ට තමන්ගේම කර්මාන්තශාලාවකට ටික කලකදී යොමු කිරීමටයි හැකියාව ලබා දෙන්නේ.

මේ සැලසුම් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රාග්ධනය හා මූල්‍ය ආධාර ලබාදීමට විදේශීය ආයතන බොහොමයක් කැමැත්ත පළ කරල තියෙනවා. මේ යටතේ නෝර්වේ තානාපති කාර්යාලය මගින් ස්වීඩන් තානාපති කාර්යාලයෙන් හා පොදු රාජ්‍ය මණ්ඩලය හා සම්බන්ධ ආයතනයන්ද සහයෝගය ලබාදීමට කැමැත්ත පළකරල තියෙනවා.

මෙතෙක් ශ්‍රී ලංකාව තුළ දේශීය කර්මාන්තයට හිතකර පරිසරයක් සකස් වී නොතිබුණු අතර, ඒ සඳහා අවශ්‍ය පාලන අධිකාරියක් ද තිබුණේ නෑ. එහෙත් මේ වන විට කුඩා හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය මෙන්ම කාර්මික සංවර්ධන මණ්ඩලයද දේශීය කර්මාන්තය ගොඩනැංවීමේලා විශාල කාර්යභාරයක නිරතව සිටිනවා. මේ යටතේ ව්‍යාපෘති - සැලසුම්, සමීක්ෂණ, තාක්ෂණ වැඩමුළු හා ප්‍රදර්ශන හා අත්හදා බැලීම් සඳහා කෙටිකාලීනව හා දීර්ඝ කාලීන ව්‍යාපෘති සකස් කර ක්‍රියාත්මක කර තියෙනවා. කර්මාන්ත සඳහා සංවිධාන පිහිටුවීම, මුල්‍යාධාර පහසුකම්, සම්පත් සොයා දීම සඳහා තොරතුරු එක්රැස් කිරීම වෙළෙඳපොළ සකස් කර දීම මෙන්ම නිෂ්පාදන භාණ්ඩවල තත්ත්වය උසස් කිරීමට අවශ්‍ය තාක්ෂණය හඳුන්වා දීමද මේ වනවිට සිදු කෙරෙමින් පවතිනවා. දේශීය මෙන්ම විදේශීය ආයෝජන මගින් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත නැවත නගා සිටුවා නිෂ්පාදන ආර්ථිකයක් රටතුළ සකස් කිරීමේලා වන දැවැන්ත කාර්යයකට උරදී සිටීම මතක් කළ යුතුයි.

**ප්‍ර.:- මේ වැඩපිළිවෙළ යටතේ උපාධිධාරීන් ට අවස්ථාවක් ලබාදීමට හැකියාවක් නැතිද?**

කාර්මික සංවර්ධන මණ්ඩලය මගින් සිදුකරනු ලබන ව්‍යාපෘති සඳහා; අවශ්‍ය සමීක්ෂණ සඳහා අලුතින් බඳවා ගනු ලැබූ උපාධිධාරීන් යොදවා ගෙන තියෙනවා. ඒ හැරුණ විට විශ්ව විද්‍යාල වලින් පිටවන උපාධිධාරීන්ද මේ දැවැන්ත ව්‍යාපෘති සඳහා බඳවා ගැනීමට අදහස් කර තියෙනවා. කුඩා හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය සහ ලංකා කර්මික සංවර්ධන මණ්ඩලය පසුගිය සුනාමි විපතින් විනාශ වූ කර්මාන්ත සම්බන්ධව ගවේෂණ කටයුතු වව්නියාව උතුරු ප්‍රදේශයද සාර්ථකව කර ගැනීමට උපාධිධාරීගේ දායකත්වය විශාල ලෙස ලබාගෙන තියෙනවා. සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට උපාධිධාරී ව්‍යාපාර සංවර්ධන කලමණාකරුවන් පත්කිරීමට සැලසුම් කර තියෙනවා.